# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,157 - 2020 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2020.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 02 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 02 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 19 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


***සැ. යු.*** - විවාහ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ජනවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1 – B 081592 — 403 (2020/01)

# රජයේ නිවේදන

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### ජනමාධ්‍යවේදී මාධ්‍ය හැඳුනුම්පතේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා ජනාමාධ්‍යවේදීන්ට නිකුත් කරන ලද මාධ්‍ය හැඳුනුම්පතෙහි වලංගු කාලසීමාව 2020.03.31 දක්වා දීර්ඝ කරන ලදී.

නාලක කලුවැව,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,

01 - 484

---

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**මූල්‍ය ප්‍රකාශන**

**එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

**ස්වාධීන විගණක වාර්තාව**

**එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමෙහි කළමණාකාරීත්ව කමිටුව වෙත**

**මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව**

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමෙහි (පදනම) 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් සහ වියදම් ප්‍රකාශ සහ දිනට අවසන් වූ වර්ෂයෙහි අරමුදල් සහ මුදල් ප්‍රවාහ වෙනස්වීම සහ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සංග්‍රහයක් සහ අනෙකුත් තොරතුරු පැහැදිලි කිරීම් වලින් සමන්විත ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත.

**මතය :**

අපගේ මතය වනුයේ මූල්‍ය ප්‍රකාශ මගින් 2018 දෙසැම්බර් 31 වැනි දිනට පදනමෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනට අවසන් වූ කාලපරිච්ඡේදයෙහි දී එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිමයන් සඳහා (SME සඳහා SLFRS) වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව ය.

**මතය සඳහා පදනම**

අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (SMAuS) අනුකූලව සිදු කර ඇත. එම ප්‍රමිත යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවෙහි මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරයාගේ වගකීම් ඡේදයෙහි වැඩිදුරට විස්තර කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම සංග්‍රහයට අනුගතව අප පදනමෙන් ස්වාධීන වන අතර අප විසින් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව අපගේ අනෙකුත් ආචාර විධි සපුරනු ලැබ ඇත. අප ලබාගෙන ඇති විගණන සාක්ෂි අපගේ මතයට පදනමක් සැකසීම සඳහා ප්‍රමාණවත් බව අපි විශ්වාස කරමු.

**අනෙකුත් තොරතුරු**

අනෙකුත් තොරතුරු සඳහා කළමණාකාරීත්ව මණ්ඩලය වගකිය යුතුය.

මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර ඒ මත කිසිදු ආකාරයක සහතික කිරීම් නිර්ණයක් අප ප්‍රකාශ කරන්නේ නැත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකාරීත්වයෙහි සහ පාලන බලධාරීන්ගේ වගකීම්**

කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා අදාළවන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත (SME සඳහා SLFRS) වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමණාකාරීත්වයෙහි වගකීම වන අතර වංචා හෝ වැරදීම් හේතුකොට ගත් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් නිදහස්ව ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමණාකාරීත්ව මණ්ඩලය නිගමනය කරන අභ්‍යන්තර පාලක හේතුවෙන්ද කළමණාකාරීත්ව මණ්ඩලය වගකිව යුතුය.

කළමණාකාරීත්ව මණ්ඩලය විසින් එක්කෝ පදනම ඈවර කිරීමෙන් හෝ මෙහෙයුම් නතර කිරීම අපේක්ෂා කිරීම හෝ එසේ කිරීම හැර වෙනත් සැබෑ විකල්පයක් නොමැති නම් හැරුණු විට අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු යථාපරිදි හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්මෙන් කරගෙන යාම තක්සේරු කිරීම වෙනුවෙන්ද මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මට පිළියෙළ කිරීම වෙනුවෙන්ද කළමණාකාරීත්වය වගකිව යුතුය.

පදනමෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අභිපේක්ෂණය කිරීම වෙනුවෙන් පාලන බලධාරීන් වගකිව යුතුය.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශන සමස්ථයක් ලෙස, වංචා හෝ වැරදි හේතුකොටගත් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් නිදහස් බවට හේතු සහගත තහවුරුවක් ලබා ගැනීම සහ අපගේ මතය අන්තර්ගත වන වාර්තාවක් නිකුත් කිරීම අපගේ අරමුණුය. හේතු සහගත තහවුරුවක් උසස් තහවුරු කිරීම් මට්ටමක් වුවද එය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව කරනු ලබන විගණනයක් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇති සැම විටකම එය අනාවරණය කරන බවට සහතිකයක් නොවේ.

සාවද්‍ය ප්‍රකාශ වංචා හෝ වැරදි වලින් උද්ගත විය හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබන්නේ තනිව හෝ සමාහාරව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන භාවිතා කරන්නන් විසින් ගන්නා ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් සිදු කරන්නේ යැයි හේතු සහගතව අපේක්ෂා කල හැකි වන්නේ නම් ය.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණක වරයාගේ වගකීම් පිළිබඳ වැඩිවනත් විස්තර ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත වෙබ් අඩවියෙහි http://slaasc.com/auditing/auditorsresponsibility.php හි දක්වා ඇත. මෙම විස්තරය අපගේ විගණන වාර්තාවෙහි කොටසක් වෙයි.

2019 දෙසැම්බර් මස 16 වැනි දින,

වරලත් ගණකාධිවරු,
කොළඹ.

**එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**දෙසැම්බර් මස 31 වැනි දිනට**

| | | | |
|---|---|---|---|
| | | *2018* | *2017* |
| | *සටහන්* | *රු. ශත* | *රු. ශත* |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම** | | | |
| දේපළ පිරියත සහ උපකරණ (නිදහස්) | **2.1** | 955,632,596 | 967,962,190 |
| දේපළ පිරියත සහ උපකරණ (CHOGM) | **2.2** | 14,125,206 | 21,570,887 |
| කුළී වත්කම් | **2.3** | | 6,127,495 |
| කෙරීගෙන යන වැඩ | | | 4,310,510 |
| අස්පෘශ්‍ය වත්කම | 3 | 1,157,316 | 1,371,769 |
| ජංගම නොවන මූල්‍ය වත්කම | 4 | 40,431,781 | 41,029,141 |
| ජංගම නොවන වත්කම් එකතුව | | **1,011,346,899** | **1,042,371,992** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | **5** | 19,052,039 | 12,631,842 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | **6** | 171,072,690 | 148,643,403 |
| කෙටි කාලීන ආයෝජන | **7** | 1,751,518,311 | 1,248,511,759 |
| තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම් | **8** | 16,773,845 | 24,146,107 |
| මුදල් සහ මුදල් සමාන දෑ | **9** | 110,931,021 | 105,332,563 |
| | | **2,069,347,906** | **1,539,265,674** |
| **වත්කම් එකතුව** | | **3,080,694,805** | **2,581,637,666** |

| | සටහන් | *2018* *රු. ශත* | *2017* *රු. ශත* |
|---|---|---|---|
| අරමුදල් සහ වගකීම් | | | |
| අරමුදල් | | | |
| ප්‍රාග්ධන සංචිතය | | 925,522 | 925,522 |
| ප්‍රාග්ධන ආධාර අරමුදල | 10 | 354,044,574 | 364,622,370 |
| CHOGM අරමුදල | 10 | 14,125,206 | 21,570,887 |
| එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සමුච්චිත අරමුදල | | 2,370,488,6 | 1,858,880,440 |
| | | **2,739,583,922** | **2,245,999,219** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| මූල්‍ය කල්බදු වගකීම් | 11.1 | 333,298 | 5,883,497 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 12 | 67,736,213 | 61,120,757 |
| | | **68,069,511** | **67,004,254** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 13 | 141,703,295 | 153,677,250 |
| උපචිත වියදම් | 14 | 121,481,460 | 110,463,111 |
| මූල්‍ය කල්බදු වගකීම් | 11.2 | 4,493,831 | 4,493,832 |
| බැංකු අයිරාව | 9 | 5,362,786 | |
| | - | | |
| | | 273,041,372 | 268,634,193 |
| **වගකීම් එකතුව** | | 341,110,883 | 335,638,447 |
| **අරමුදල් සහ වගකීම් එකතුව** | | 3,080,694,805 | 2,581,637,666 |

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගතික කොටසක් වන අදාළ සටහන් සමග එක්ව ගෙනය. මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඇති බව සහතික කරමි.

........................................, ........................................,

මුදල් කළමණාකරු ප්‍රධාන විධායක/ අධ්‍යක්ෂක

කුඩා සහ මධ්‍ය පරිමාණ අස්තිත්වයන් (SME) සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ගැන කළමණාකරන කමිටුව වගකිව යුතුය.
කමිටුව වෙනුවෙන් සහ කමිටුවේ නාමයෙන් අනුමත කර අත්සන් කළේ :

........................................, ........................................,

සභාපති මණ්ඩල සාමාජික

2019 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ.

## එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

### ආදායම් සහ වියදම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | *2018* *රු. ශත* | *2017* *රු. ශත* |
|---|---|---|---|
| ආදායම | 15 | 1,140,542,968 | 1,066,682,672 |
| සෘජු මෙහෙවුම් වියදම් | | (466,197,000) | (441,137,660) |
| දළ අතිරික්තය | | **674,345,968** | **625,545,012** |
| වෙනත් ආදායම් | 16 | 78,202,115 | 81,247,405 |
| පරිපාලන වියදම් | | (215,380,104) | (198,151,774) |
| අලෙවි කරන වියදම් | | (11,047,511) | (7,780,474) |
| මූල්‍ය වියදම් | 17 | (1,263,586) | (1,718,415) |
| වෙනත් වියදම් | 18 | (13,248,702) | (5,705,444) |
| බදු වියදමට පෙර අතිරික්තය | 19 | **511,608,180** | **493,436,310** |
| ආදායම් බදු වියදම් | | - | - |
| ආදායම් බදු වියදමට පසු අතිරික්තය | | **511,608,180** | **493,406,310** |

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මූල්‍ය ප්‍රකාශන වල සංගතික කොටස් වන අදාළ සටහන් සමග එක්ව ගෙන ය.

## එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

### අරමුදල් වෙනස්වීම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | *ප්‍රාග්ධන සංචිතය* *රු.* | *එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සමුච්චිත අරමුදල (ඒකාබද්ධ)* *රු.* | *ප්‍රාග්ධන ආධාර අරමුදල* *රු.* | *CHOGM 2013 අරමුදල* *රු.* | *එකතුව සංචිත* *රු.* |
|---|---|---|---|---|---|
| **2017 ජනවාරි මස 01 වැනි දිනට ශේෂය** | **925,522** | **1,365,474,130** | **375,200,167** | **33,570,187** | **1,775,170,006** |
| වර්ෂයෙහි අතිරික්තය/ මාරුකිරීම් | - | 493,406,310 | - | - | 493,406,310 |
| වර්ෂය තුළ පාවිච්චියට ගත් | - | - | (10,577,797) | (11,999,300) | (22,577,097) |
| **2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය** | **925,522** | **1,858,880,440** | **364,622,370** | **21,570,887** | **2,245,999,219** |
| වර්ෂයෙහි අතිරික්තය | - | 511,608,180 | - | - | 511,608,180 |

| | ප්‍රාග්ධන සංචිතය | එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සමුච්චිත අරමුදල (ඒකාබද්ධ) | ප්‍රාග්ධන ආධාර අරමුදල | CHOGM 2013 අරමුදල | එකතුව සංචිත |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වර්ෂය තුළ භාවිතය | - | - | (10,577,796) | (7,445,681) | (18,023,477) |
| **2018 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය** | **925,522** | **2,370,488,620** | **354,044,574** | **14,125,206** | **2,739,583,922** |

මුල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මුල්‍ය ප්‍රකාශන වල සංගතික කොටස් වන අදාළ සටහන් සමග එක්ව ගෙන ය.

## එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

### අරමුදල් වෙනස්වීම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | | පුනප්‍රකාශය |
| බදු වියදමට පෙර අතිරික්තය | | 511,608,180 | 493,406,310 |
| **මුදල් නොවන ආදායම් සහ වියදම් වලට ගැලපිලි -** | | | |
| දේපළ පිරියත සහ උපකරණ ක්ෂය | | 69,559,809 | 77,249,072 |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 258,823 | 1,178,717 |
| පොළී ආදායම | | (168,110,702) | (106,633,684) |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 12,180,453 | 9,867,016 |
| අස්පෘශ්‍ය වත්කම් ලියාහැරීම් | | - | 2,488,238 |
| වාණිජ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රතිපාදන/ ලියා හැරීම් | | (36,102,513) | - |
| තොග සඳහා අධිවෙන්කිරීම් ප්‍රතිවර්ත්‍ය කිරීම් | | - | (4,773,288) |
| වාණිජ, ව්‍යවස්ථාපිත සහ වෙනත් ගෙවිය යුතු දෑ ප්‍රතිවර්ත්‍ය කිරීම්/ ආපසු හැරීම් | | 6,139,394 | - |
| WHT ලියා හැරීම් | | 5,417,124 | - |
| දේපළ පිරියත සහ උපකරණ ඉවත් කිරීම් අලාභ | | (3,502,572) | - |
| කල්බදු පොළිය | | 853,722 | 1,391,757 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **398,283,718** | **474,174,138** |
| **වෙනස්වීම් ;** | | | |
| තොග | | (6,420,197) | (2,554,197) |
| වාණිජ සහ වෙනත් ලැබිය යුතු දෑ | | (22,429,287) | (45,925,382) |
| තැන්පතු, කලින් ගෙවීම්, අත්තිකාරම් සහ වෙනත් | | 7,372,262 | (12,258,593) |
| වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් ගෙවිය යුතු දෑ උපචිත | | (955,606) | 56,666,257 |
| **මෙහෙයුම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **375,850,890** | **470,102,223** |
| පාරිතෝෂික ගෙවීම් | | (5,564,997) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉපයුනු ශුද්ධ මුදල් ප්‍රමාණය** | | **370,285,893** | **470,102,223** |

| | සටහන | *2018* *රු.* | *2017* *රු.* |
|---|---|---|---|
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ | | | |
| ලැබුනු පොලී ආදායම් | | 125,623,105 | 71,779,563 |
| දේපළ පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | | (44,246,687) | (19,410,162) |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම් | | (44,370) | - |
| ස්ථිර තැන්පතුවල ශුද්ධ ආයෝජන | | (434,051,970) | (809,800,643) |
| කෙරීගෙන යන වැඩවල වර්ෂය තුළ එකතු කිරීම් | | - | (3,874,104) |
| ස්ථාවර වත්කම් සහ පාරිභෝජනීය භාණ්ඩ ඉවත් කිරීමෙන් ලැබීම් | | 5,646,016 | 145,445 |
| සේවක මණ්ඩල ණය වැඩිවීම් (අඩුවීම්) | | 597,360 | (9,459,345) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල්** | | **(346,476,546)** | **(770,619,246)** |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | | |
| විශේෂිත අරමුදල්වල අඩුවීම | | (18,023,477) | (22,577,097) |
| වර්ෂය තුළ ගෙවූ කල්බදු වාරිකය | | (5,550,198) | (4,994,163) |
| මුල්‍ය ක්‍රියාකාරකම් වල භාවිත කළ ශුද්ධ මුදල් | | **(23,573,675)** | **(27,571,260)** |
| මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 235,672 | (328,088,283) |
| **වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ** | | 105,332,563 | 433,420,846 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | | **105,568,235** | **105,332,563** |

මුල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මුල්‍ය ප්‍රකාශන වල සංගතික කොටස් වල අදාළ සටහන් සමඟ එක්ව ගෙන ය.

**ප්‍රකාශන මතසටහන්**

*2018 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

1. **ගිණුම්කරන ප්‍රතිපත්ති**

1.1 වාර්තාකරණය අස්තිත්වය

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම ("පදනම") **1975** අංක **02** දරන එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනම් නීතිය යටතේ ජාතික මන්ත්‍රණ සභාවෙන් ස්ථාපනය කර ඇත. ප්‍රධාන මෙහෙයුම් ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය, කොළඹ 07, බෞද්ධාලෝක මාවතෙහි පිහිටුවා ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය**

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනම ජාත්‍යන්තර සමගිය, අවබෝධතාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජීය ක්ෂේත්‍ර වල මෙන්ම ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනීම ව්‍යාප්ත කිරීමත් ජාත්‍යන්තර අර්බුද අධ්‍යයනයට සහ සංවාදයට දිරිදීම සහ ප්‍රවර්ධනය උදෙසා කාර්යාල සඳහා පරිශ්‍රයන් බදු දීම සහ මහජන අවශ්‍යතා සඳහා ශාලා කුලියට දීම පදනමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්ය.

**ජාත්‍යන්තර අධ්‍යයනයන් සඳහා බණ්ඩාරනායක කෙන්ද්‍රය**

ජාත්‍යන්තර සබඳතා, ජාත්‍යන්තර සාම නීති, තානාපති විෂයයන් ආදියෙහි සෑම අංශයකටම අදාළ අධ්‍යනයන් සහ පර්යේෂණ දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම කේන්ද්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම්ය.

**1.2 සුදානම් කිරීමේ පදනම**

(a) **අනුකූලතා ප්‍රකාශය**

2018 දෙසැම්බර් මස 31 වැනි දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශණය, ආදායම් සහ වියදම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශ වලට සටහන් වලින් පදනමේ මුල්‍ය ප්‍රකාශ සමන්විත වේ.

**මිනුම් කිරීම් පදනම**

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය මතය. උද්ධමන සාධක වෙනුවෙන් ගැලපිළි මුල්‍ය ප්‍රකාශ වල සිදු කර නැත.

(b) **ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීම් මුදල්**

මෙම මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ පදනමේ ව්‍යවහාරික මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය.

(c) **ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය**

SME සඳහා SLRFS ප්‍රමිත වලට අනුගතව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මිනුම් කරන ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි යොදා ගැනීමේදී බලපානු ලබන විනිශ්චයන් ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පන සිදු කිරීම කළමණාකාරිත්වයෙන් අවශ්‍ය කෙරේ. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන වාතාවරනයන් යටතේ හේතු සාධක යැයි විශ්වාස කරනු ලබන විවිධ සාධක සහ ඓතිහාසික පළපුරුද්ද මත පදනම් වේ, වෙනත් මූලාශ්‍රයන්ගෙන් ක්ෂනිකව පෙන්නුම් කරනු නොලබන වත්කම් හා වගකීම් වල ධාරණ අගය පිළිබඳව විනිශ්චය කිරීම එහි ප්‍රතිඵලයක් වන්නේ ය. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ අනුයුක්ත උපකල්පන ප්‍රගාමීව සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු කරන ලද කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරන ඇස්තමේන්තු සංශෝධනයන් අදාළ වනුයේ සංශෝධනයන් මුදල් වර්ෂයට පමණක් බලපානවිට හෝ සංශෝධනය කරනු ලබන කාලපරිච්ඡේදයට සහ අනාගත කාලපරිච්ඡේදවලට, බලපාන්නේ නම් සහ සංශෝධනය ප්‍රවර්තන සහ අනාගත මුදල් වර්ෂ වලට බලපාන්නේ නම් පමණකි.

**1.3 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මෙම මුල්‍ය ප්‍රකාශන වලින් ආවරණය වන සියලු කාලපරිච්ඡේද වලට පහත සඳහන් කරනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්ති සංගති කව භාවිතා කරනු ලැබ ඇත.

(a) **විදේශීය මුදල් ගණුදෙනු**

විදේශීය මුදල් වලින් කරනු ලබන ගණුදෙනු ඒ ඒ ගණුදෙනු සිදු වූ දින වල බලපැවැත් වූ විනිමය අනුපාතයන් අනුව රුපියල් වලට පරිවර්තනය කර ඇත. වාර්තා කරන ලද දිනට විදේශීය මුදලින් දැක්වෙන ලද මුල්‍යමය වත්කම් හා වගකීම් රුපියල් වලට පරිවර්තනය කර ඇත්තේ වාර්තා කරනු ලබන දිනට බලපැවැත්වූ විනිමය අනුපාතයටය. පරිවර්තනයන්ගෙන් උද්ගතවන විදේශ විනිමය වෙනස්කම් සහ වියදම් ප්‍රකාශනයෙහි ඒ අයුරින් හඳුනාගෙන ඇත.

(b) **දේපළ පිරියත සහ උපකරණ**

(i) **භාරගැනීම් සහ මිනුම්කරණය : සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභ අඩු කළ පිරිවැයට දේපළ පිරියත සහ උපකරණ මිනුම් කරනු ලබයි.**

වත්කම් පවරා අත්පත් කරගැනීමට සහ වත්කම් ක්‍රියාත්මක තත්ත්වයට ගෙනඒමට ගෙනඒමට සෘජුවම අදාළ වන වියදම් පිරිවැයට ඇතුළත්ය. දේපළ පිරියත සහ උපකරණ වල ධාරණ අගය ඒවායෙහි අපහරණ උත්පාදන සමඟ සැසඳීමෙන් දේපළ පිරියත සහ උපකරණ අපහරණය කිරීමේ ලැබීම/අලාභ ගණනය කරනු ලැබ ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි "අනෙකුත් ආදායම්" යටතේ හඳුනා ගැනේ.

(ii) **ක්ෂය**

වත්කමෙහි ප්‍රයෝජනවත් ඇස්තමේන්තුගත ආයුකාලය සඳහා හීන වන ශේෂ ක්‍රමය අනුව එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ පදනමෙහි සහ CHOGAM අරමුදලෙහි ක්ෂය වීම ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි. ප්‍රවර්තනාත්මක හා සංසන්දනාත්මක කාල පරිච්ඡේද වෙනුවෙන් වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි ය.

**එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ පදනම**

| | ක්ෂය අනුපාත |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| පුස්තකාල පොත් | 20% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 10% |
| මෝටර් රථ | 25% |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 20% |
| සම්මන්ත්‍රණ පද්ධතිය | 12.5% |
| අනෙකුත් උපකරණ | 20% |
| කලාල සහ තිර | 33.3% |
| පිඟන් සහ හැඳි ගෑරුප්පු | 20% |
| විදුලි උපකරණ | 20% |
| ලිනන් | 12.5% |
| කන්ටේනරය | 10% |
| මාර්ග | 10% |
| වෙළෙඳ කුටි | 10% |
| CHOGAM 2013 අරමුදලේ වත්කම් | |
| හයිබ්‍රිඩ් ගොඩනැගිල්ල | 3% |
| SBMEC ශාලා ගොඩනැගිල්ල | 2% |
| PVC ආවරණ | 50% |
| මෝටර් රථ | 25% |
| ගෘහ භාණ්ඩ හා උපකරණ | 20% |

(c) **අස්පෘශ්‍ය වත්කම**

පරිගණක මෘදුකාංග බලපත් ප්‍රාග්ධනීකරණය කර ඇත්තේ විශේෂිත මෘදුකාංග අත්පත් කර ගැනීමට සහ භාවිතයට ගෙන ඒමට දරන ලද පිරිවැය පදනම් කර ගනිමින් ය. මෙම පිරිවැය හීනවන ශේෂ ක්‍රමය මත ඒවායේහි ප්‍රයෝජනවත් ආයුකාලය වන වසර 8ක කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලබයි.

(d) **කල්බදු වත්කම්**

මූල්‍ය කල් බදු යටතේ වන දේපළ පිරියත සහ උපකරණ (කල්බදු අයිතම වල අයිතියට ආශ්‍රිත සියලුම වියදම් සහ ප්‍රතිලාභ පලදායි වශයෙන් අවසානයේ පදනමට මාරු කරනු ලබන) යතෝක්ත කල් බදු වත්කම් මගින් එල ප්‍රයෝජන ලැබීමට කාලපරිච්ඡේද තුළදී ඒවායේ මුදල් වටිනාකම ප්‍රාග්ධනීකරණය කර ක්ෂය/ක්‍රමක්ෂය කරනු ලැබේ. කල්බදුකරුට ගෙවිය යුතු අනුභූති මුල් මුදල වගකීමක් ලෙස පෙන්වනු ලබයි.

එක් එක් මුදල් වර්ෂයට අදාළ කල් බදු වගකීමේ පොලී ප්‍රමාණය එක් එක් කාලපරිච්ඡේද අවසානයේ ඒකාකාරී අනුපාතයක් විදහා දැක්වීම පිණිස ඉතිරිවී ඇති වගකීම් ක්ෂය කාලපරිච්ඡේදය තුළ ආදායම් සහ වියදම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

(e) **තොග**

තොග පිරිවැයට අගය කරනු ලැබේ. තොග වල පිරිවැය "පෙර ඇතුළු පෙර නිකුතු" ප්‍රතිපත්තිය මත පදනම් වන අතර තොග අත්පත් කර ගැනීමේ සහ තොග දැනට පවත්නා ස්ථානයට සහ ඒතත්වයට ගෙන ඒමට දරන ලද වියදම පිරිවැයට ඇතුළත් ය.

(f) **ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් වල ස්ථිර තැන්පතුවල කෙටි කාලීන අයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි.

(g) **වාණිජ්‍ය අනෙකුත් ලැබිය යුතු දෑ**

අනෙකුත් ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධි අගයට සටහන් කර පවත්වාගෙන යනු ලැබේ. වර්ෂය අවසානයේ සියලුම ලැබිය යුතු ප්‍රමාණයන් සමාලෝචනය කර ඒ පදනමින් බොල් සහ අඩමාන ලැබීය යුතු දෑ ඇස්තමේන්තු කෙරේ.

(h) **සහ මුදල් සමාන දෑ**

අත ඉතිරි මුදල්, ඉල්ලූ විගස මුදාහරින බැංකු තැන්පතු මුදල්වලින්, මුදල් සහ මුදල් සමාන දෑ සමන්විතය.
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරමාර්ථ උදෙසා අත ඉතිරි මුදල්, ඉල්ලූ විගස මුදාහරිනු ලබන බැංකු තැන්පතු සහ ශුද්ධ බැංකු අයිරා වලින් මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වේ. බැංකු අයිරා මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම්වල ඇතුළත් ය.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශන**

වක්‍ර ක්‍රමය අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත.

(i) **හානිකරණය**

පදනමේ මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයන් හාණිකරණනයක් සිඳු වන බවට හැඟවීමක් ඇත් දැයි නිශ්චය කිරීමට වාර්ථා කරන දිනයක් පාසා සමාලෝචනය කෙරේ. කවර හෝ හැඟවීමක් පවත්නේ නම් වත්කමෙහි අයකරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලබයි.
වත්කමක ධාරණ අගය අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවන්නේ නම් හාණිකරන ආලාභයක් හඳුනා ගනු ලබයි. හානිකරන අලාභ ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි.

(j) **වත්කම් හා ප්‍රතිපාදන**

අතීත ප්‍රතිපලවල වගකීමක් වශයෙන් ප්‍රවර්තන බැඳීමක් පවත්නා විට මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි වගකීම් ලෙස හඳුනාගනු ලබන අතර එය සමථය කිරීම ආර්ථික ප්‍රතිලාභවල අන්තර්ගතව පවත්නා සම්පත් පිටතට ගලායාම ප්‍රතිපලයක් වශයෙන් සිදු වන බව අපේක්ෂා කරනු ලබයි. ණය හිමියන් ඉල්ලුම් කළ විට ගෙවිය යුතු බැඳීම් හෝ වාර්තා කරන දිනයෙන් එක් වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස සැලකේ. වාර්තා කරන දිනයෙන් එක් වසර පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම නොවන වත්කම් ලෙස සළකනු ලබයි.

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වාස කටයුතු අයුරින් ඇස්තමේන්තු කළ හැකි නෛතික හෝ නිර්මාණාත්මක වගකීමක් පදනමට වර්තමානයෙහි ඇත්තේ නම් සහ වගකීම් සමථය කිරීමට ආර්ථික ප්‍රතිලාභ වල පිටතට හලා යාමට අවශ්‍යතාවක් තිබිය හැකි නම් ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබයි.

(k) **විශේෂිත අරමුදල්**

හඳුනා ගත් කර්තව්‍යයන් සඳහා භාවිතා කිරීමට අරමුදල් ලැබීමේ දී එකී කර්තව්‍ය වෙනුවෙන් දරන ලද වියදම් සමග ගැළපීමට එවැනි අරමුදල් විශේෂිත අරමුදල් ගිණුමක රඳවාගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ. භාවිතා නොකළ අරමුදල් ඒවා අවශ්‍යවන තෙක් අදාළ අරමුදල් ගිණුම් වල රඳවාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් කරනු ලැබේ.

(I) **බදුකරණය**

**ආදායම් බදුකරණය**

පදනම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7(ඉ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වේ.

(m) **සේවක ප්‍රතිලාභ**

(i) **නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම**

පාරිතෝශිකය නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ආඥා පනතෙහි විධිවිධානවලට අනුව පාරිතෝශිත ගෙවීමට පදනම වගකීමෙන් බැඳේ. සියලුම සේවකයින් වෙනුවෙන් ඔවුන්ගේ පළමු සේවා වසරෙන් පටන්ගෙන සම්පූර්ණ කළ සෑම අවුරුද්දකටම මුදල් වර්ෂයේ අවසාන මාසයත් අඩක් සමාන ප්‍රමාණයක් මත ගණනය කර ලද ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ඉදිරියට ගෙන එනු ලැබේ.

1983 අංක 12 පාරිතෝෂිත ගෙවීම් ආඥා පනත යටතේ සියලුම සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන සපයා ඇත. ප්‍රතිපාදනය පදනමෙන් පරිබාහිරව අරමුදලක ආයෝජනය නොකෙරේ. ප්‍රතිපාදනය බාහිර අරමුදලකින් නඩත්තු නොවන අතර ආයුගණකව අගය කිරීමක් සිදුකිරීමක්ද නැත.

(ii) **නිර්වචිත දායකත්ව සැළැස්ම**

නිර්වචිත දායකත්ව සැලසුම්වල බැඳීම් මූල්‍ය ප්‍රකාශනයෙහි වියදම් කරනු ලැබූ සේ හඳුනා ගැනේ. පදනම විසින් සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 12% සහ 03%ක් අනු පිළිවෙලින් අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල වෙනුවෙන් දායක කරයි.

(n) **ආදායම**
**ආදායම හඳුනා ගැනීම**

පදනමට ගලා එන ආර්ථික ප්‍රතිලාභ සහ ආදායම සහ දරනු ලැබූ හෝ දැරීමට ඇති ආශ්‍රිත පැරිවැය විශ්වාසනීය අයුරින් මිශ්‍ර කළ හැකිතාක් දුරට ආදායම හඳුනා ගැනේ. වෙළඳ වට්ටම් සහ පිරිවැටුම් බදු අත්හැර ප්‍රමාණය ලැබූ හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාව ලෙස සාධාරණ අගයට ආදායම මිනුම් කරනු ලබයි.

(o) **වියදම්**

පදනමේ වර්ෂයට අතිරික්තය ගණන් බැලීමේ දී පදනමේ මෙහෙයුම් සහ ප්‍රාග්ධන වත්කම් ඵලදායී තත්වයෙන් නඩත්තු කිරීම සඳහා දැරූ සියලුම වියදම් ගිණුම් ගත කරනු ලැබේ.

(p) **මූල්‍ය ආදායම සහ වියදම**

ණය ගැනුම් මත පොළී වියදම්, මූල්‍ය වියදම් බැංකු ගාස්තු සහ හර බද්දෙන් මූල්‍ය වියදම් සමන්විත ය. සියලුම ණය ගැණුම් පිරිවැය ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි සඳහන් කෙරේ.

(q) **සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍යතැන් හිදී ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග තහවුරු වීමට සංසන්දනාත්මක ඉලක්කම් පිළියෙල කර සකස් කර තිබේ.

1.3 **සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති (සම්බන්ධවයි)**

(r) **වාර්තා කළ දිනට පසු ඇති වන සිදු වීම**

වාර්තාකරණයට පසු සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අදාළ ගැළපිලි සහ හෙළිදරව් කිරීම් ඊට සම්බන්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල සඳහන් වේ.

(s) **බැඳීම් සහ සම්භාව්‍යතා**

අතීත සිදුවීම් සහ අනාගත සිදුවීම් සිදුවීම සිදු නොවීම මත පමණක් තහවුරු කෙරෙනු ඇති පදනමෙහි පාලනයෙන් පරිබාහිරව වත්කම් හෝ වගකීම් බැඳීම් යනුවෙන් හැඳින්වේ. බැඳීම් සහ සම්භාව්‍යතා වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට සටහන්වල හෙළිදරව් කර ඇත.

## එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

### මුල්‍ය ප්‍රකාශන මත සටහන්

දෙසැම්බර් 31 දිනට

**2.1 දේපළ පිරියත සහ උපකරණ - නිදහස් වත්කම්**

| පිරිවැය | 2018 ජනවාරි 01 දිනට ශේෂය රු. | එකතු කිරීම් රු. | බැහැරලීම් රු. | 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල | 9,42,486,967 | 29,014,641 | - | 971,501,608 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 12,100,000 | - | - | 12,100,000 |
| මෝටර් වාහන | 48,599,771 | - | (8,392,964) | 40,206,807 |
| අනෙකුත් උපකරණ | 25,268,444 | 1,277,753 | (36,500) | 26,509,697 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 53,212,225 | 4,081,670 | (2,476,897) | 54,816,997 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 2,124,626 | 989,054 | (103,040) | 3,010,641 |
| හිඟන් කෝප්ප | 226,553 | - | - | 226,553 |
| විදුලි උපකරණ | 71,407,149 | 8,557,520 | (1,140,250) | 78,824,419 |
| කන්ටේනරය | 960,862 | - | - | 960,862 |
| මාර්ග ගිණුම | 32,717,258 | 326,050 | - | 33,043,308 |
| වෙළඳ කුටි | 4,962,395 | - | - | 4,962,395 |
| | 1,194,066,251 | 44,246,687 | (12,149,651) | 1,226,163,287 |

| සමුච්චිත අගය | 2018 ජනවාරි 01 දිනට ශේෂය රු. | වර්ෂයෙහි ක්ෂය රු. | බැහැරලීම් මත ක්ෂය රු. | 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල | 75,432,125 | 19,468,748 | - | 94,900,873 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 3,014,306 | 1,210,000 | - | 4,224,306 |
| මෝටර් වාහන | 46,263,653 | 1,439,815 | (8,392,964) | 39,310,504 |
| අනෙකුත් උපකරණ | 8,610,954 | 5,511,427 | (22,630) | 13,703,751 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 28,557,757 | 9,942,370 | (1,875,906) | 36,624,221 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 2,124,624 | 40,192 | (103,040) | 2,061,776 |
| හිඟන් කෝප්ප | 226,553 | 13,800 | - | 240,353 |
| විදුලි උපකරණ | 40,352,345 | 15,008,285 | (697,098) | 54,663,531 |
| කන්ටේනරය | 960,862 | - | - | 960,862 |
| මාර්ග ගිණුම | 15,598,487 | 3,279,633 | - | 18,878,120 |
| වෙළඳ කුටි | 4,962,395 | - | - | 4,962,395 |
| | **226,104,061** | **55,518,269** | **(11,091,637)** | **270,530,691** |
| ශුද්ධ පොත් අගය | **967,962,190** | | | **955,632,596** |

2.2 දේපළ පිරියත සහ උපකරණ

| *පිරිවැය* | *2018 ජනවාරි 01 දිනට ශේෂය* | *එකතු කිරීම්* | *බැහැරලීම්* | *2018 දෙසැම්බර් 31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| පී. වී. සී. ආවරණ | 4,924,368 | - | - | 4,924,368 |
| Blockxi/x2/x3/x4 හයිබ්‍රිඩ් ගොඩනැගිල්ල | 7,053,000 | | | 7,053,000 |
| බුමුතුරුණු | 9,810,129 | | | 9,810,129 |
| විදුලි උපකරණ | 7,079,464 | | | 7,079,464 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 22,758,252 | | | 22,758,252 |
| අනෙකුත් උපකරණ | 2,899,801 | | | 2,899,801 |
| SBMEC - F ශාලා ගොඩනැගිල්ල | 4,209,691 | | | 4,209,691 |
| මෝටර් වාහන | 7,826,002 | | | 7,826,002 |
| | **66,560,707** | | | **66,560,707** |

| *සමුච්චිත ක්ෂය කිරීම්* | *2018 ජනවාරි 01 දිනට ශේෂය* | *වර්ෂය සඳහා ක්ෂය කිරීම්* | *බැහැරලීම් මත ක්ෂය* | *2018 දෙසැම්බර් 31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| පී. වී. සී. ආවරණ | 4,924,369 | - | - | 4,924,369 |
| Blockxi/x2/x3/x4 හයිබ්‍රිඩ් ගොඩනැගිල්ල | 642,728 | 141,060 | - | 783,788 |
| බුමුතුරුණු | 9,810,129 | - | - | 9,810,129 |
| විදුලි උපකරණ | 4,817,357 | 1,415,893 | - | 6,233,249 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 15,803,895 | 4,551,650 | - | 19,887,182 |
| අනෙකුත් උපකරණ | 1,973,223 | 579,960 | - | 2,553,183 |
| SBMEC - F ශාලා ගොඩනැගිල්ල | 333,406 | 84,194 | - | 417,599 |
| මෝටර් වාහන | 6,684,713 | 1,141,288 | - | 7,826,002 |
| | **44,989,820** | **7,914,045** | - | **52,435,501** |
| ශුද්ධ පොත් අගය | **21,570,887** | | | **14,125,206** |

2.3 දේපළ පිරියත සහ උපකරණ

| *පිරිවැය* | *2018 ජනවාරි 01 දිනට ශේෂය* | *වර්ෂය සඳහා ක්ෂය කිරීම්* | *බැහැරලීම් මත ක්ෂය* | *2018 දෙසැම්බර් 31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| මෝටර් වාහනය | 25,800,000 | - | - | 25,800,000 |
| | **25,800,000** | - | - | **25,800,000** |

| *සමුච්චිත ක්ෂය කිරීම්* | *2018 ජනවාරි 01 දිනට ශේෂය රු.* | *වර්ෂය සඳහා ක්ෂය කිරීම් රු.* | *බැහැරලීම් මත ක්ෂය රු.* | *2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.* |
|---|---|---|---|---|
| මෝටර් රථය | 19,672,505 | 6,127,495 | - | 25,800,000 |
| | **19,672,505** | **6,127,495** | - | **25,800,000** |
| ශුද්ධ පොත් අගය | **6,127,495** | | | - |

දෙසැම්බර් 31 දිනට,

| | *2018 රු.* | *2017 රු.* |
|---|---|---|
| 3. අස්පෘශ්‍ය වත්කම් | | |
| පිරිවැය | | |
| වර්ෂය ආරම්භක ශේෂය | 2,500,315 | 4,988,554 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 44,370 | - |
| වර්ෂය තුළ ලියා හැරීම් | - | (2,488,239) |
| වර්ෂ අවසානයේ ශේෂය | **2,544,685** | **2,500,315** |
| ක්‍රම ක්ෂය | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,128,546 | 2,438,066 |
| වර්ෂය තුළ ක්‍රම ක්ෂය | 258,823 | 1,178,717 |
| බැහැර දීම් මත ක්‍රම ක්ෂය | - | (2,488,237) |
| වර්ෂ අවසානයේ ශේෂය | **1,387,369** | **1,128,546** |
| ගෙනයාමේ වටිනාකම් | **1,157,316** | **1,371,769** |
| 4. ජංගම නොවන මූල්‍ය වත්කම් | | |
| කාර්යය මණ්ඩල ණය | 41,029,141 | 31,569,796 |
| වර්ෂය ආරම්භක ශේෂය | 14,086,805 | 23,617,613 |
| වර්ෂය තුළ දෙන ලද ණය | **(14,684,165)** | **(14,158,268)** |
| වර්ෂ අවසානයේ ශේෂය | **40,431,781** | **41,029,141** |
| 5. තොග | | |
| තොගය | 20,787,737 | 14,367,540 |
| (-) තොග සඳහා ප්‍රතිපාදනය | (1,735,698) | (1,735,698) |
| | **19,052,039** | **12,631,842** |
| 6. වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | | |
| වෙළඳ ලැබිය යුතු දෑ (6.1 සටහන) | 166,015,602 | 144,943,074 |
| වෙනත් ලැබිය යුතු දෑ ප්‍රතිපූරණය (6.2 සටහන) | 4,572,668 | 3,156,162 |
| විවිධ ණය ගැතියෝ (6.3 සටහන) | 241,210 | 242,010 |
| වෙනත් ලැබිය යුතු දෑ (6.4 සටහන) | 243,209 | 302,157 |
| | **171,072,689** | **148,643,403** |

| | *2018* | *2017* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| 6.1 වෙළඳ ලැබිය යුතු දෑ | **224,561,232** | **203,488,703** |
| (-) වෙළඳ ණය ගැතියන් සඳහා ප්‍රතිපාදනය | **(58,545,630)** | **(58,545,629)** |
| | **166,015,602** | **144,943,074** |
| 6.2 වෙනත් ලැබිය යුතු දෑ (ප්‍රතිපූරණ) | | |
| ලැබිය යුතු බදු කුලි | 36,967,160 | 35,512,908 |
| (-) ලැබිය යුතු බදු කුලි සඳහා ප්‍රතිපාදන | (32,394,492) | (32,356,746) |
| | **4,572,668** | **3,156,162** |
| 6.3 විවිධ ණය ගැතියෝ | | |
| විවිධ ණය ගැතියෝ | 4,891,833 | 4,892,633 |
| (-) විවිධ ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන | (4,650,623) | (4,650,623) |
| | **241,210** | **242,010** |
| 6.4 වෙනත් ලැබිය යුතු දෑ | | |
| වෙනත් ලැබිය යුතු දෑ | 2,277,366 | 2,336,314 |
| (-) වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන | (2,034,157) | (2,034,157) |
| | **243,209** | **302,157** |
| 7. කෙටි කාලීන අයෝජන | | |
| ස්ථාවර තැන්පතු | 1,751,518,311 | 1,248,511,759 |
| | **1,751,518,311** | **1,248,511,759** |
| 8. තැන්පතු පෙර ගෙවීම් සහ අත්තිකාරම් | | |
| සේවක අත්තිකාරම් | 4,789,955 | 3,545,838 |
| ආපසු ගෙවන තැන්පතු (8.1 සටහන) | 381,004 | 431,004 |
| පෙර ගෙවීම් | 6,358,124 | 16,826,345 |
| අත්තිකාරම් ගෙවීම් (8.2 සටහන) | 787,099 | 3,342,920 |
| WHT ලැබීම් | 4,457,663 | - |
| | **16,773,845** | **241,146,107** |
| 8.1 ආපසු ගෙවන අත්තිකාරම් | | |
| ආපසු ගෙවන අත්තිකාරම් | 481,154 | 531,154 |
| (-) ආපසු ගෙවන අත්තිකාරම් සඳහා ප්‍රතිපාදන | (100,150) | (100,150) |
| | **381,004** | **431,004** |
| 8.2 අත්තිකාරම් ගෙවීම් | | |
| අත්තිකාරම් ගෙවීම් | 9,100,583 | 19,568,804 |
| (-) අත්තිකාරම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන | (2,742,459) | (2,742,459) |
| | **6,358,124** | **16,826,345** |

| | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| 9. මුදල් සහ මුදල් සමාන දෑ | | |
| බැංකුවේ මුදල් | 110,802,513 | 105,245,965 |
| අත ඉතිරි මුදල් | 128,508 | 86,598 |
| | 110,931,021 | 105,332,563 |
| (-) බැංකු අයිරාව | (5,362,786) | - |
| | **105,568,235** | **105,332,563** |
| 10. විශේෂිත අරමුදල් | | |
| ප්‍රාග්ධන ආධාර අරමුදල | 354,044,574 | 364,622,370 |
| CHOGM 2013 අරමුදල | 14,125,206 | 21,570,886 |
| | **368,169,780** | **386,193,256** |
| 11. *මූල්‍ය කල්බදු වගකීම්* | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 11,441,440 | 17,827,360 |
| වර්ෂය තුළ ලබා ගැනීම් | - | - |
| වර්ෂය තුළ ගෙවීම් | (6,385,920) | (6,385,920) |
| වර්ෂය අවසාන ශේෂය | **5,055,520** | **11,441,440** |
| *පොළී* | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,064,111 | 2,455,868 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | - |
| මුදල් ප්‍රකාශනයට අයකළ පොළී | (835,722) | (1,391,757) |
| වර්ෂය අවසාන ශේෂය | **228,389** | **1,064,111** |
| අවම කල්බදු ගෙවීමේ වර්තමාන අගය | **5,283,909** | **10,377,329** |
| 11.1 එක් වසරකට පසු ගෙවිය යුතු කල්බදු | 333,298 | 5,883,497 |
| 11.2 එක් වරසක් තුළ ගෙවිය යුතු කල් බදු | **4,493,831** | **4,493,832** |
| 12. *විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්* | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 61,120,757 | 51,253,741 |
| වර්ෂය තුළ සිදු කළ ප්‍රතිපාදන | 12,180,453 | 9,867,016 |
| වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | (5,564,997) | - |
| වර්ෂය අවසාන ශේෂය | **67,736,213** | **61,120,757** |
| 13. *වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ* | | |
| වෙළෙඳ ණය හිමියෝ | 23,114,857 | 43,673,411 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 8,165,933 | 14,064,335 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 2,204,897 | 2,138,897 |
| අත්තිකාරම් සංචිත | 108,217,608 | 93,800,607 |
| | **141,703,295** | **153,677,250** |

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| 14. *උපලබ්ධි වියදම්* | | |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ | 2,180,297 | 2,126,609 |
| ගෙවිය යුතු දිරි දීමනා | 73,594,845 | 74,191,281 |
| විවිධ උපලබ්ධි වියදම් | 33,475,128 | 15,895,245 |
| වෙනත් ගෙවිය යුතු බදු | 3,775,444 | 11,514,442 |
| නොගෙවූ වේතන | 975,835 | 949,047 |
| විගණන ගාස්තු - උපචිත වියදම් | 7,188,400 | 2,500,019 |
| දුරකථන ගාස්තු - ගෙවිය යුතු | 291,511 | 243,314 |
| ගෙවිය යුතු අතිකාල | - | 3,043,154 |
| | **121,481,460** | **110,463,111** |
| 15. *ආදායම්* | | |
| කුළී ආදායම් | 640,265,908 | 645,568,959 |
| බදු කුළී ආදායම | 205,039,674 | 197,250,925 |
| පොළී ආදායම | 168,110,702 | 106,633,684 |
| කොමිස් ආදායම | 98,962,609 | 98,339,191 |
| භාෂා පාඨමාලා ගාස්තු | 11,687,050 | 6,396,900 |
| ජාත්‍යන්තර සබඳතා පාඨමාලා ගාස්තු | 16,477,025 | 12,493,013 |
| | **1,140,542,968** | **1,066,682,672** |
| 16. *වෙනත් ආදායම්* | | |
| සීමාකල අරමුදල්වල ක්‍රමක්ෂය | 18,023,477 | 22,577,096 |
| විවිධ ලැබීම් ආදායම | 4,242,120 | 3,146,769 |
| දුරකථන ආදායම | 11,341,746 | 10,438,692 |
| වත්කම් බැහැර කිරීම් ලැබීම් | 4,588,002 | 30,000 |
| මිශ්‍ර ආදායම් | 370,305 | 493,287 |
| වෙනත් ලැබිය යුතු දෑ සඳහා අධි ප්‍රතිපාදන | 36,102,513 | - |
| වෙනත් ආදායම් | - | 38,998,854 |
| පුස්තකාල දෙපාර්තමේන්තුව | 372,165 | 316,155 |
| අනෙකුත් ආදායම් | - | 144,956 |
| සේවක සංවරනය වන තොග සඳහා ප්‍රතිපාදන | - | 4,773,288 |
| සුන්බුන් අයිතම බැහැරලීම් ආදායම | - | 115,445 |
| විදේශ විනිමය ලාභය | 3,161,787 | 212,863 |
| | **78,202,115** | **81,247,405** |
| 17. *මූල්‍ය වියදම්* | | |
| කල්බදු පොළී | 410,856 | 1,391,757 |
| බැංකු ගාස්තු | 839,972 | 326,658 |
| | **1,250,828** | **1,718,415** |
| 18. *වෙනත් වියදම්* | | |
| සුන්බුන් අයිතම බැහැරලීම් ආදායම් | 1,085,430 | - |
| ප්‍රදාන | 30,000 | 40,000 |
| වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන | 6,139,394 | - |
| රඳවා ගැනීම් ලියා හැරීම් | 5,417,124 | 5,665,444 |
| | 12,671,948 | 5,705,444 |

| | 2018 රු. | 2017 රු. |
|---|---|---|

19. *බදු පෙර අතිරික්තය*

බදු පෙර අතිරික්තය නිර්නය කිරීමේදී පහත දැක්වෙන අයිතම වියදම් ලෙස හඳුනාගෙන ඇත.

| | | |
|---|---|---|
| කාර්යය මණ්ඩල පිරිවැය | - | 268,410,805 |
| නිර්වචික දායකත්වය සැලසුම් පිරිවැය සේ. අ. අ. සහ සේ. නි. අ. | 17,663,722 | 15,922,533 |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 12,180,453 | 9,867,016 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 69,818,632 | 78,427,789 |
| විගණකවරුන්ගේ ගාස්තු | 6,456,791 | 1,200,000 |

20. **සම්බන්ධිත පර්ශව ගනුදෙනු**

**20.1 ප්‍රමුඛ කළමනාකාරිත්ව පුද්ගලයින් සමග ගනුදෙනු**

පදනමෙහි කළමණාකාරිත්ව කමිටුවේ සාමාජිකයින් පදනමෙහි ප්‍රමුඛ කළමණාකාරිත්ව පුද්ගලයින් වශයෙන් සලකනු ලබති. ප්‍රමුඛ කළමණාකාරිත්ව පුද්ගලයින්ට ගෙවන ලද අනුපූරක ගෙවීම් පහත දැක්වෙන අයුරින්ය.

| | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | - | - |
| | - | - |

21. **බැඳීම් සහ අනිශ්චිතතා**

පහත දැක්වෙන දෑ හැරුණු විට වර්තා කරන කාල පරිච්ඡේදය අවසන් වන විට මුල්‍ය ප්‍රකාශනවල ගැලපිලි කිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සැලකිය යුතු ප්‍රාග්ධන බැඳීම් හෝ අනිශ්චිතතා නොතිබුණේය.

22. **නඩු සහ හිමිකම් පෑම්**

වාර්තා කරන දිනට පදනමට එරෙහිව පහත දැක්වෙන නඩු සහ හිමිකම් පෑම් පවතියි.

22.1 එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනමෙහි රැකියාව අවසන් කිරීම පිළිබඳව, පදනමෙහි කලින් සේවිකාවක් වූ ඉන්ද්‍රානි කලුආරච්චි මිය රු. 150,000.00 හිමිකමක් ඉදිරිපත් කරමින් පදනමට එරෙහිව නඩුවක් පවරා ඇත. මෙම නඩුව සාර්ථක අන්දමින් විත්තිවාචනය කරන ලදුව 2019 ජනවාරි 11 වැනි දින මහාධිකරණය විසින් නිශ්ප්‍රභා කරන ලදී. මෙම විෂය කාරණය අවසාන නිර්ණය පිණිස කම්කරු විනිශ්චය සභාව විසින් විභාග කරනු ඇත.

22.2 පදනමෙහි කලින් සේවකයෙකු වූ ප්‍රනාන්දු මහතා විසින් නැවත සේවයෙහි පිහිටුවන ලෙස ඉල්ලමින් පදනමට එරෙහිව නඩුවක් පවරා ඇත.

23. *වාර්තාකරන දිනට පසුව සිදුවන සිදුවීම්*

මුල්‍ය ප්‍රකාශනවල ගැලපිලි කිරීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන සැලකිය යුතු සිදුවීම් වාර්තා කරන දිනට පසුව සිදුවී නැත.

24. *මුල්‍ය ප්‍රකාශන අනුමත කිරීම*

මෙම මුල්‍ය ප්‍රකාශන කළමණාකාරිත්ව මණ්ඩලයෙන් අනුමත කරන ලදුව 2019 දෙසැම්බර් මස 16 වැනි දින නිකුත් කිරීමට බලය දෙන ලදී.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පුත්තලම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : වර්ණකුලසූරිය පෝරුතොටගේ ජූඩ් ලලිත් නිශාන්ත ප්‍රනාන්දු.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, වර්ණකුලසූරිය පෝරුතොටගේ ජූඩ් ලලිත් නිශාන්ත ප්‍රනාන්දු යන අය "බන්ධනදායී /උකස්කරු" වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එච්. එන්. නවාව් විසින් සහතික කරන ලද වර්ෂ 2018.02.09 දිනැති අංක 9768 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 9768 දරන උකස්කරයන් මත,

අ) වර්ෂ 2019.10.27 වැනි දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දහතුන් මිලියන තුන් ලක්ෂ විසිනවදහස් අටසිය නවයයි ශත හතලිස් හයක (රු. 13,329,809.46) මුදලක් ද, වර්ෂ 2019.10.28 වැනි දින සිට රුපියල් දොළොස් මිලියන හත් ලක්ෂ විසිතුන් දහස් අටසිය පහළොවයි ශත පනස් පහක (රු. 12,723,815.55) මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද,

ආ) වර්ෂ 2019.10.27 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දහනව ලක්ෂ තුන් දහස් එකසිය එකොළහයි ශත හැත්තෑ දෙකක (රු. 1,903,111.72) මුදලක් ද, වර්ෂ 2019.10.28 වැනි දින සිට රුපියල් දහඅට ලක්ෂ දහසය දහස් තුන්සිය විසිදෙකයි ශත විසිතුනක (රු. 1,816,322.23) මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද,

ඇ) වර්ෂ 2019.09.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දහනව ලක්ෂ තිස්අට දහස් නවසිය හැට තුනයි ශත පනස් හතක (රු. 1,938,963.57) මුදලක් ද, වර්ෂ 2019.10.01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රු. 1,000,000.00 සීමාව දක්වා වූ මුදලක් මත වර්ෂයකට 18% බැගින් වූ පොළිය ද රු. 1,000,000ක සීමාව ඉක්මවූ මුදල මත වර්ෂයකට 29% බැගින් වූ පොළිය ද,

ඉහත කී බන්ධනදායිගෙන්/ උකස්කරුගෙන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු මුලු මුදල වන රුපියල් දහහත් මිලියන එක් ලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය අසූහතරයි ශත හැත්තෑ පහක (රු. 17,171,884.75) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාම්පුරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්පිටිය කොට්ඨාසයේ, අක්කරෙයිපත්තු උතුරේ, මාම්පුරිය ග්‍රාමයේ පිහිටි විටාඩිතෝට්ටම් නමැති සහ බලයලත් මිනින්දෝරු වී. ටී. බාලසුබ්‍රමණියම් විසින් මැන සාදන ලද 1996.11.15 දිනැති අංක 923 දරන පිඹුරේ ලොට් 01 යනුවෙන් නිරූපිත විශාලත්වයෙන් රූඩ් එකයි පර්චස් විසි හයයි දශම බිංදුවයි පහක් (අ. 0, රූ. 1, පර්. 26.05) වන උතුරින් : එම්. එමානුවෙල් සුනිල් ප්‍රනාන්දු සතු ඉඩම ද, නැගෙනහිරින් : සුනිල් ප්‍රනාන්දු සතු ඉඩම සහ ශාන්ත සේවියර්ස් පල්ලිය ද, දකුණින් : ඩබ්ලිව්. පී. අමිල තයන්ත ප්‍රනාන්දු සතු ඉඩම සහ ශාන්ත සේවියර්ස් පල්ලිය ද, බස්නාහිරින් පාර (ගම් සභා) යන මායිම් තුළ පිහිටි සියලු දෙය. මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D29/117හි ලියාපදිංචි කර ඇත.

මැතක දී සිදු කරන ලද මැනීමක් පරිදි ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු එස්. මරියතාස් විසින් මැන සාදන ලද 2016.06.26 දිනැති අංක KP 1914 දරන පිඹුරේ ලොට් 01 යනුවෙන් දැක්වෙන අතර විශාලත්වයෙන් රූඩ් එකයි පර්චස් විසි හයයි දශම බිංදුවයි පහක් (අ. 0, රූ. 1, පර්. 26.05) වන අතර උතුරින් : පාර (ප්‍රාදේශීය සභා) සහ එම්. එමානුවෙල් පීල්ලේ සතු ඉඩම ද, නැගෙනහිරින් : සුනිල් ප්‍රනාන්දු සතු ඉඩම ද ශාන්ත සේවියර්ස් පල්ලිය ද, දකුණින් : ශාන්ත සේවියර්ස් පල්ලිය සතු ඉඩම සහ ඩබ්ලිව්. පී. අමිල දයන්ත ප්‍රනාන්දු සතු ඉඩම ද, බස්නාහිරින් : ඩබ්ලිව්. පී. අමිල දයන්ත ප්‍රනාන්දු සතු ඉඩම සහ පාර (ප්‍රාදේශීය සභා) මෙම මායිම් තුළ පිහිටි සියලු දෙය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

01 - 252

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණයදෙනුකරුවන්ගේ නම් : වන්නිආරච්චිගේ නිව්ටන් අමරදාස ෆොන්සේකා සහ මුණසිංහ කුමාරතුංග ආරච්චිගේ ප්‍රේමලතා ෆොන්සේකා.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2019 ක්වූ මැයි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, වන්නිආරච්චිගේ නිව්ටන් අමරදාස ෆොන්සේකා සහ මුණසිංහ කුමාරතුංග ආරච්චිගේ ප්‍රේමලතා ෆොන්සේකා යන අය බන්ධනදායින් ලෙස සහ මුණසිංහ කුමාරතුංග ආරච්චිගේ ප්‍රේමලතා ෆොන්සේකා උකස්කරු ලෙස ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. අරලියා දයානන්ද විසින් ලියා සහතික කරන ලද 2016.09.21 දිනැති අංක 334 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 334 දරන උකස්කරය මත,

අ) වර්ෂ 2019 ක්වූ මැයි මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හැට ලක්ෂ අනූ තුන් දහස් හතලිස් නවයයි ශත අසූ නවයක (රු. 6,093,049.89) මුදලක් ද, වර්ෂ 2019 ක්වූ මැයි මස 03 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් පනස් අටලක්ෂ හත් දහස් නවසිය හැත්තෑ හයයි ශත නවයක් (රු. 5,807,976.09) දක්වා වූ මුදල මත වර්ෂයකට 21%ක පොළිය ද,

ආ) වර්ෂ 2019 ක්වූ අප්‍රේල් මස 30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දහතුන් ලක්ෂ අසූහතර දහස් දෙසිය හතලිස් එකයි ශත අසූනවයක (රු. 1,384,241.89) මුදලක් ද, වර්ෂ 2019 මැයි මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රු. 1,000,000.00ක සීමාව දක්වා වූ මුදලක් මත වර්ෂයකට 18% බැගින් වූ පොළිය ද රු. 1,000,000ක සීමාව ඉක්මවූ මුදල මත වර්ෂයකට 29% බැගින් වූ පොළිය ද,

ඉහත කී බන්ධනදායිගෙන්/ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

